22140179

International Baccalaureate®
Baccalauréat International
Bachillerato Internacional

**SINHALESE A: LITERATURE – STANDARD LEVEL – PAPER 1**
**SINGHALAIS A : LITTÉRATURE – NIVEAU MOYEN – ÉPREUVE 1**
**SINGALÉS A: LITERATURA – NIVEL MEDIO – PRUEBA 1**

Friday 9 May 2014 (morning)
Vendredi 9 mai 2014 (matin)
Viernes 9 de mayo de 2014 (mañana)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Write a guided literary analysis on one passage only. In your answer you must address both of the guiding questions provided.
- The maximum mark for this examination paper is *[20 marks]*.

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- N'ouvrez pas cette épreuve avant d'y être autorisé(e).
- Rédigez une analyse littéraire dirigée d'un seul des passages. Les deux questions d'orientation fournies doivent être traitées dans votre réponse.
- Le nombre maximum de points pour cette épreuve d'examen est *[20 points]*.

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Escriba un análisis literario guiado sobre un solo pasaje. Debe abordar las dos preguntas de orientación en su respuesta.
- La puntuación máxima para esta prueba de examen es *[20 puntos]*.


© International Baccalaureate Organization 2014

**මෙම ඡේද අතුරෙන් එකක් සඳහා සාහිත්‍යමය විවරණයක් සපයන්න. පහත දක්වා ඇති උපකාරක ප්‍රශ්න දෙකට පිළිතුරු ඇතුළත් වන සේ විවරණය ඉදිරිපත් කළ යුතුයි.**

**1.**

තාත්තා මුළු ජීවිතයම කැප කළේ අපගේ සුවසෙත උදෙසාය. කුසට අහරක්, ඇඳුමක් පැළඳුමක් තාත්තා කිසි දිනෙක නොපැතුවා වැනිය. නිදි වැරීමෙන්ම රතුවී තිබූ ඔහුගේ දෙනෙත් අප පවුලේ අභාග්‍ය සම්පන්න භාවයම හුවා දැක්විය.

රෑ එළිවෙන තුරු පෝරණුව සමග ඔට්ටු වන තාත්තා උදේ රැයින්ම බර බැඳගෙන බයිසිකලය සමග පොර බදමින් කඩයක් කඩයක් ගානේ ඇවිදින්නට පටන් ගනී. එම කාරිය අවසන් කර නැවත පෝරණුව වෙත පැමිණ කහට උගුරකින් සප්පායම් වී වරුවක් තිස්සේ පසු දින පෝරණුව ගිනි ගැන්වීම සඳහා දර පැලීමට පටන් ගනී. කිසිවෙක් තාත්තාගේ අත් උදව්වට නැත. දරුවෙකුගෙන් අත් උදව්වක් ඔහු කිසිවිටෙක නොපැතුවේය. දිනපතාම දහවල් එකොළහත් දෙකත් අතර කාලයේදී පෝරණුවේම ඇති බූරු ඇඳමත දිගාවී නැවත දෙකට අවදි වන ඔහු යළිත් වැඩෙහි යෙදෙයි.

තාත්තාගේ දින චරියාව කිසි දිනක වෙනස් නොවන සුලු විය. තාත්තා විඳි වද වේදනා තුළින් එල නෙලා ගත්තේ අයියා පමණකැයි මම සිතමි. අයියා සමාජයේ හොඳ මිනිහෙකු ලෙස වැජඹෙනු දැකීම තාත්තාගේ ඒකායන පරමාර්ථය වූ බව මම දනිමි. එහෙත් අයියා හොඳ මිනිහෙකුවීම කෙසේ වෙතත් ලොකු මිනිහෙකු බවට නම් පත් විය.

පරිපාලන විභාගයෙන් ඉහළින් සමත් වූ අයියා පරිපාලන නිලධාරිණියක හා විවාහ වූවේ ය. අයියාගේ විවාහය දා අපගේ නිවස මතින් කණ කොකෙකු හඬා ගෙන ගිය හැටි මගේ පසු කුහරයේ තවමත් නින්නාද වෙනු දැනේ. අප පවුලේ අවාසනාවන්ත ඉරණමේ පළමු පෙරනිමිත්ත අයියාගේ විවාහයත් සමගින් උදාවිය. අයියාගේ බිරින්දෑ උසස් රැකියාවක නිරත උසස් පෙළැන්තියකට හිමිකම් කියන්නියකැයි ඇසූ අම්මා බෙහෙවින් සතුටට පත්විය.

එහෙත් අයියා විවාහ වූ බව පවසා විවාහ වූ දිනෙන් සති දෙකකට පමණ පසුව එවන ලද ලියුම කියවූ තාත්තා එයට කිසිම ප්‍රතිචාරයක් නොදැක්විය. එකම ප්‍රතිචාරය, ඉතා අඩුවෙන් අප සමග කතා කරන ඔහු එයද නවතා දැමීම පමණී. උන්මත්තකයෙකුසේ බලා ගත්වනම බලා සිටීමට පුරුදු වූ තාත්තා තමා ගේ දෛනික වැඩ කොටස ඉටු කිරීමට අමතක නොකළේය.

ගෙමිදුල පාන්දරින් පවිත්‍ර කළ අම්මා කඩිමුඩියේ එහෙ මෙහෙ දුව පනිමින් විවාහයෙන් පසු එන අයියා සහ ඔහුගේ බිරිඳ පිළිගැනීමට සූදානම් වූවාය. තාත්තා ද අලුයමින් තම රාජකාරි හමාර කර දැමීය. ගේ ඉදිරිපිට ගුරු පාරේ සේපාලිකා ගසෙන් බිම පතිත වූ සේපාලිකා මල් පියවිල්ල අම්මා විසින් ඉවත් නොකරන ලදී. එය නව යුවළට පා තැබීමට පාවඩයක් සේ ඇය තවත් පිළිසකර කළා දැයි මට මතක නැත.

අයියා බිරින්දෑ සමග පැමිණ තාත්තාටත් අම්මාටත් බුලත්දී දණ ගසා වඳින ලද මොහොතේ අම්මා සතුටින් ඉල්පි සිටි සැටිත්, කිසිම දිනෙක කිසිම කරුණක් උදෙසා වත් කඳුලක් නොහෙලූ තාත්තාගේ ඇස් කඳුලින් තෙත්වී ගිය ආකාරයත් මගේ හදවත සිදුරු කරලන තරම් වේදනාවක් ඇති කරලීය. තාත්තා අයියා සමග හෝ බිරින්දෑ සමග හෝ වචනයක් නොදෙඩුවේය. ටික වේලාවකින් පෝරණුවට ගොස් එහි තිබෙන බූරු ඇඳ මත දිගාවී හිස් අහස් කුස දෙස බලා ගෙන මුලු දවසම ගෙවා දැමීය.

**එදා තාත්තාගේ දෑස් පෙහවූ කඳුළු අප සැමගේ නෙත් තුළට රුවාලමින් අයියාගේ විවාහයෙන් සිව් මසකට පසු තාත්තා පෝරණුවේදීම අපෙන් වෙන්විය. මරණාසන්න මොහොතේ තාත්තා ළඟ සිටියේ කවුරුන්දැයි මට සිතා ගත නොහැකිය. ඔහු වේදනාවෙන් බූරුැ ඇඳ මත දඟලන මොහොතේ රාස්සයකුගේ ගිනි ජාලා නංවමින් ඇවිළුණු පෝරණුව මහා ගිනි දැල් රාශියක් පෝරණු කටින් විසිකර හඳිසියේ මුනිවරයකු සේ සාන්ත විය.**

**තාත්තාගේ මරණය සඳහා හැම සතයක්ම වියදම් කළෙ අයියාය. එහෙත් ඔහු පාසංකූලය දීමෙන් පසු සොහොන් පිටිය කරාවත් නොගොස් ආපසු පිටත්විය. තාත්තා අම්මා සමග නංගී අසල මා තනිකර දමා ගියේ යයි මට ඒ මොහොතේ සිතුණි.**

**සරත් විජේසූරිය, තාත්තා** (1992)

(a) **මෙම පාඨයෙන් ඉදිරිපත් වන පසුබිම, එහි අවස්ථා නිරූපණයෙහිලා වැදගත් වන්නේ කෙසේද?**

(b) **කථිකයා මුහුණ පාන අත්දැකීම පිළිබඳව පාඨකයා තුළ අනුවේදනීය හැඟීම් දැනවීමට, කොතෙක් දුරට සාර්ථක රචනා උපක්‍රම මෙහි යොදාගෙන ඇද්ද?**

**2.**

**නගේ නුඹට දැන ගන්නයි කියන්නේ**

නගේ නුඹට දැන ගන්නයි කියන්නේ
ගම්මානෙට හොරු එනවා බොලන්නේ
ආලවඩන සුරංගනා
කතා කියන්නේ
මාල වළලු පලදින්නයි
මාන බලන්නේ
බාල බොළඳ හිත රවටා
ගන්න සොඳුරු ගම්මානේ
ඔය බොරු චාටු දුටු මතින්
නුඹ රැවටෙන්න එපා නගේ

අඹ රඹුටන් මොර මාදන්
වෙරළු ජම්බු ජම නාරන්
නුඹ වටකර අතු බරවී
ගම හැඩ වෙන්නේ
එහෙවි නගේ නුඹ මොකටද
එතෙර ඒදේසෙන් එන එන
අරුමෝසම් පොදි බැඳගන්නේ
පොකුරු පොකුරු රස පලතුරු
ඇත නිරතුරු ඇතිවෙන තුරු
ගමට නුහුරු ඔය බොරු
චාටු දුටු මතින්
නුඹ රැවටෙන්න එපා නගේ

ඉද්ද සමන් අරලිය මල්
වැටට උඩින් කුඹුරු ගොයම්
නුඹ වටකර කිරට නැමී
ගම හැඩ වෙන්නේ
එහෙවි නගේ නුඹ මොකටද
එතෙර ඒදේසෙන් එන එන
අරුමෝසම් පොදි බැඳගන්නේ

අපට මිතුරු ලෙස විසකුරු
නෙක උවදුරු එයි නිරතුරු
ගමට නුහුරු ඔය බොරු
චාටු දුටු මතින්
නුඹ රැවටෙන්න එපා නගේ

රෝහණ බැද්දගේ, ගම්මානේ උපන් ගීත (1992)

(a) අවිහිංසක බව හා කපටිකම අතර වෙනස මෙම කවි පන්තියෙන් ඉස්මතු කර දැක්වෙන ආකාරය විමසන්න.

(b) තම පණිවුඩය පාඨකයා වෙත ගෙන යාම සඳහා කවියා මෙහිදී උපයෝගී කරගෙන ඇති වාග් විලාසය ගැන අදහස් දක්වන්න.